සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2025 ජූලි

(201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2025-07-26
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  උත්තර ලිවීම සඳහා - පැය 03 යි.
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

A කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

01 වන ප්‍රශ්නය

අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 **සීමාසහිත Zara සමාගම,** පිරිවැය රු.65,000,000/- ක් වූ මෝටර් රථයක් 2023 අප්‍රේල් 01 දින මිලදී ගන්නා ලදී. මෝටර් රථයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 4 ක් වන අතර, ප්‍රයෝජනවත් ආයු කාලය අවසානයේ ඇස්තමේන්තුගත සුන්බුන් අගය රු.5,000,000/- ක් වේ. සමාගම විසින් එහි මෝටර් රථ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබයි. 2025 මාර්තු 31 දිනට මෝටර් රථයේ ධාරණ අගය වූයේ:

(1) රු.32,500,000/-. (2) රු.35,000,000/-.
(3) රු.30,000,000/-. (4) රු.41,000,000/-. (ලකුණු 02)

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, පිරිවැය ඒකකයක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) බේකරියක්. (2) ආපන ශාලාවක්. (3) හෝටලයක්. (4) පාන් ගෙඩියක්.

(ලකුණු 02)

1.3 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

(a) තොග අගය කිරීම සඳහා, පළමු ලැබීම් පළමු නිකුතු කිරීම් [First-In-First-Out (FIFO)] ක්‍රමය සහ බර තැබූ සාමාන්‍ය (Weighted Average) පිරිවැය ක්‍රමය භාවිත කරනු ලබයි.

(b) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට, තොග අගය කරනු ලැබේ.

(c) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ඇති කාර්යාල උපකරණ, තොග ලෙස සළකනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 (LKAS - 02) - තොග ප්‍රමිතයට අනුව, ඉහත සඳහන් ඒවායින් නිවැරදි ප්‍රකාශ තෝරන්න:

(1) **(a)** සහ **(b)** පමණි.

(2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි.

(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

1.4 2025 ජූනි මාසය සඳහා, **සීමාසහිත සත් සමාගමෙන්** පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

මාසය සඳහා සත්‍ය පොදුකාර්ය පිරිවැය	රු.840,000/-
මාසය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය	රු.800,000/-
මාසය සඳහා අයවැයගත සෘජු ශ්‍රම පැය	පැය 25,000
මාසය සඳහා සත්‍ය සෘජු ශ්‍රම පැය	පැය 28,000

මාසය සඳහා වන ඌන හෝ අධි පොදුකාර්ය අන්තර්ග්‍රහණ පිරිවැය වනුයේ:

(1) රු.56,000/- ක අධි අන්තර්ග්‍රහණයකි.

(2) රු.56,000/- ක ඌන අන්තර්ග්‍රහණයකි.

(3) රු.100,800/- ක අධි අන්තර්ග්‍රහණයකි.

(4) රු.100,800/-. ක ඌන අන්තර්ග්‍රහණයකි

(ලකුණු 02)

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) හවුල්කරුවන් විසින් සපයා ඇති ණය සඳහා පොලී ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් නොමැත.

(2) සමාන මාසික වැටුපක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.

(3) ලාභ හෝ අලාභ සමසමව බෙදා ගැනීම සඳහා හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.

(4) හවුල් ව්‍යාපාරයට නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී, දැනට සිටින සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත අවශ්‍ය නොවේ. (ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.6 මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

1.7 මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ගිණුම්කරණය අතර ඇති වෙනස්කම් තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

1.8 **සීමාසහිත Azeen සමාගමේ, කාර්යය අංක 5000** ට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

සෘජු අමුද්‍රව්‍ය	:	කිලෝග්‍රෑමයක් රු.150/- ක් බැගින් කිලෝග්‍රෑම් 1,200
සෘජු ශ්‍රමය	:	පැයකට රු.500/- බැගින් පැය 400
නිෂ්පාදන පොදුකාර්ය	:	සෘජු ශ්‍රම පිරිවැයෙන් 75%

සමාගම, විකුණුම් මිලෙන් 15% ක ලාභයක් පවත්වා ගෙන යයි.

කාර්යය අංක 5000 මත අයකළ යුතු මිල ගණනය කරන්න. (ලකුණු 03)

1.9 පහත සඳහන් තොරතුරු, 2025 මාර්තු මාසය සඳහා **සීමාසහිත World-Wide (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී:

	රු.
මූලික වැටුප	9,420,000
අතිකාල	1,100,000
කාර්ය මණ්ඩල සුභසාධන දායකත්වය සඳහා අඩු කිරීම්	15,000
අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] මත අඩුකිරීම්	520,000

සමාගම, මූලික වැටුපෙන් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] සහ 3% ක් සේවක භාර අරමුදලට [Employees Trust Fund (ETF)] දායක වේ. සේවක අර්ථසාධක අරමුදලට සේවකයින්ගේ දායකත්වය 8% කි.

2025 මාර්තු මාසය සඳහා **සීමාසහිත World-Wide (පෞද්ගලික) සමාගම** විසින් ගෙවූ ශුද්ධ වැටුප ගණනය කරන්න. (ලකුණු 03)

1.10 **A** සහ **B** යනු පිළිවෙලින් ලාභා'ලාභ 2 : 1 අනුපාතයට බෙදාගන්නා **"Young Partners"**, හවුල් ව්‍යාපාරයේ, හවුල්කරුවන් වූහ. 2024 අප්‍රේල් 01 දින, **C** නව හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ වූ අතර, ලාභා'ලාභ හවුල්කරුවන් අතර සමසමව බෙදා ගැනීමට එකඟ වූහ.

A සහ **B** ගේ කැපකළ අනුපාතය (sacrificing ratio) ගණනය කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 50)

02 වන ප්‍රශ්නය

ජනත්, 2023 ජනවාරි 01 දින, මුදලින් රු.5,000,000/- ක් ආයෝජනය කරමින් **"ජනත් කෙයා"** නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය, චර්ම සුරැකුම් නිෂ්පාදිත (skincare products) ඉන්දියාවෙන් ආනයනය කොට අලෙවි විධායකයින් හරහා බස්නාහිර පළාත පුරා බෙදාහැරීමේ නිරතව සිටී.

"ජනත් කෙයා" හි අනෙකුත් වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.'000)*

දිනට	2024 දෙසැම්බර් 31	2024 ජනවාරි 01
මෝටර් වාහන - ධාරණ අගයට	20,000	22,500
ලී බඩු සහ සවිකිරීම් - ධාරණ අගයට	2,300	2,800
තොග	3,488	2,678
වෙළෙඳ ණයගැතියෝ	4,895	3,475
මුදල් සහ බැංකු ශේෂ	?	12,858
උපචිත විදුලිය සහ ජලය	62	54

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) ව්‍යාපාර කටයුතු කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක සිදුකරන අතර, මෙම ගොඩනැගිල්ල සඳහා 2024 ජනවාරි 01 දින කුලී ගිවිසුමකට එළඹුණි. මාසික කුලිය රු.60,000/- කි. 2024 ජනවාරි 01 දින, වර්ෂයකට අදාල කුලිය සහ මාස 6 ක අත්තිකාරම් මුදල, ගොඩනැගිල්ලේ හිමිකරුට ගෙවන ලදී.

(2) වර්ෂය තුළදී, දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් මිලදී ගෙන හෝ ඉවත්කොට නොමැත.

(3) වර්ෂය තුළදී, ණය මත සිදුකළ විකුණුම් රු.28,200,000/- ක් වූ අතර, මෙය මුළු විකුණුම්වලින් 75% කි. ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතය, විකුණුම්වලින් 40% ක් වූ අතර, සියලුම මිලදී ගැනීම්, අත්පිට මුදලට සිදුකරන ලදී.

(4) **ජනත්** විසින් 2023 ජනවාරි 01 දින සිට අලෙවි විධායකයින් 5 දෙනෙකු සේවයේ යොදවා ඇති අතර, විකුණුම් කොමිස්වලට අමතරව, එක් අයෙකු සඳහා මාසික වැටුප රු.145,000/-. කි. අලෙවි විධායකයින් සඳහා මුළු විකුණුම්වලින් 2% ක්, විකුණුම් කොමිස් ලෙස ගෙවනු ලබයි. 2024 ජනවාරි 01 දින සිට ව්‍යාපාරයේ පරිපාලන නිලධාරියා රු.50,000/- ක මාසික වැටුපක් ලැබීමට හිමිකම් දරයි. සෑම මසකම අවසානයේදීම, විකුණුම් කොමිස් සහ වැටුප් ගෙවනු ලබයි.

(5) වර්ෂය සඳහා වන, විදුලි සහ ජල වියදම් රු.672,000/- ක් විය.

(6) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, වෙනත් කිසිදු ආදායමක් හෝ වියදමක් නොමැත.

ඔබ විසින් කල යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය. (ලකුණු 07)

(b) 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන (ස්කන්ධ) ශේෂය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය

ලසිත්, තිසිත්, සහ **සුමිත්** මෑතකදී තම වෘත්තීය අධ්‍යාපන කටයුතු අවසන් කළ අතර, 2024 ජනවාරි 01 දින සිට **"LNS ඇසෝසියේට්ස්"** යන නමින් හවුල් ව්‍යාපාරයක් ලාභා'ලාභ සමානව බෙදා ගනිමින් ආරම්භ කරන ලදී.

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- හවුල්කරුවන් රු.20,000/- ක මාසික වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.
- ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.

(2) **සුමිත්** ට අයත් පරිශ්‍රයක ව්‍යාපාරය පිහිටා ඇති අතර, ඔහුට රු.25,000/- ක මාසික කුලියක් ලැබීමට හිමිකමක් තිබේ. වර්ෂයට අදාල කුලිය ගෙවා නොමැති අතර, එය ගිණුම්ගත කිරීමක්ද සිදුකර නොමැත.

(3) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.11,901,000/- ක් විය.

(4) පහත සඳහන් ශේෂයන් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටාගෙන ඇත: *(රු.'000)*

	හර	**බැර**
2024 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම්:		
ලසිත්		1,500
තිසිත්		1,500
සුමිත්		1,800
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සිදුකළ ගැනීලි:		
ලසිත්	300	
තිසිත්	200	

(5) 2024 දෙසැම්බර් 31 දින, **සුමිත්** හවුල් ව්‍යාපාරයෙන් ඉවත්වීමට තීරණය කළ අතර, **ලසිත්** සහ **තිසිත්** එක්ව ලාභා'ලාභ පිළිවෙලින් 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය එම නමින්ම පවත්වාගෙන යාමට එකඟ වූහ.

(6) 2024 දෙසැම්බර් 31 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.2,400,000/- කට අගය කළ අතර, එය කීර්තිනාම ගිණුමක් පවත්වා ගැනීමෙන් තොරව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපිය යුතුය.

ඔබ විසින් කල යුතු දෑ:

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **LNS ඇසෝසියේට්ස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ සිටින වෘත්තීය රූපලාවන්‍ය ශිල්පීන් විසින් 2022 ජනවාරි 01 දින, සාමාජික සුභසාධක සංගමයක් පිහිටුවා ගත් අතර, එහි අරමුණ වනුයේ කර්මාන්ත ප්‍රමිතීන් ඉහළ නැංවීම, රූපලාවන්‍යාගාර වෘත්තිකයින් සඳහා අවශ්‍ය පුහුණුව සහ සහාය ලබාදීම වේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) 2024 ජනවාරි 01 දිනට, සාමාජිකයන්ගේ තොරතුරු පහත පරිදි වේ:

හිඟ සාමාජික ගාස්තු	සාමාජිකයින් 5 දෙනෙක්
ඉදිරියට ගෙවූ සාමාජික ගාස්තු	සාමාජිකයින් 8 දෙනෙක්
සාමාජිකයින් සංඛ්‍යාව	සාමාජිකයින් 105

(2) සාමාජිකයෙකු සඳහා වාර්ෂික සාමාජික ගාස්තුව රු.15,000/- කි. වර්ෂය තුළදී, නව සාමාජිකයින් 5 දෙනෙකු 2024 වර්ෂයට අදාලව ඔවුන්ගේ සාමාජික ගාස්තු ගෙවා සංගමයට සම්බන්ධ වූහ.

(3) 2024 දෙසැම්බර් 31 දිනට, ඉදිරියට ගෙවූ සාමාජික ගාස්තු නොවූ අතර, සාමාජිකයින් 8 දෙනෙකුගේ සාමාජික ගාස්තු හිඟ විය.

(4) සංගමයේ සාමාජිකයින්ගේ පුහුණු කටයුතු පැවැත්වීම සඳහා සංගමයට රු.1,500,000/- ක පරිත්‍යාග ලැබී ඇත. ඒ අනුව, ලැබුණු මුළු පරිත්‍යාග මුදලම භාවිත කරමින් පුහුණු වැඩසටහනක් පවත්වා තිබේ.

(5) සාමාජික කටයුතු පුළුල් වීමත් සමඟ, 2024 ජූලි 01 දින ලේකම්වරයෙකු බඳවාගෙන ඇත. ලේකම්වරයා රු.30,000/- ක මාසික වැටුපක් ලැබීමට හිමිකම් දරනු ලබයි. ලේකම්වරයාගේ පරිහරණය සඳහා එදිනම රු.300,000/- කට ලැප්ටොප් පරිගණකයක් මිලදීගෙන ඇති අතර, එය වසර 5 ක ප්‍රයෝජනවත් ආයු කාලයක් තුළ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමට තීරණය කරන ලදී.

(6) 2024 දෙසැම්බර් 15 දින, සාමාජිකයින්ගේ සුහද හමුවක් පවත්වනු ලැබූ අතර, සංගමයේ සාමාජිකයින් 90 දෙනෙකු, එක් සාමාජිකයෙක් රු.18,000/- බැගින් වූ ඇතුලත් වීමේ ගාස්තුවක් ගෙවා ඊට සහභාගී වූහ.

(7) පහත සඳහන් වියදම් දරණ ලදී:

වියදම්	**සංගමයේ ක්‍රියාකාරකම් (සුහද හමුව හැර) (රු.)**	**සුහද හමුවේ ක්‍රියාකාරකම් (රු.)**
ලිපිද්‍රව්‍ය	55,000	25,000
දුරකතන හා අන්තර්ජාල ගාස්තු	* 60,000	-
ගමන් වියදම්	45,000	15,000
කුලී වියදම්	360,000	240,000
සංගීත කණ්ඩායම සහ නිවේදන කටයුතු	-	60,000
සාමාජිකයින්ට දුන් ත්‍යාග	-	500,000

* මෙය තුළ 2023 දෙසැම්බර් මස බිල්පත සඳහා ගෙවන ලද රු.5,000/- ක් ඇතුලත් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංගමයේ පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 03)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත Victor (පෞද්ගලික) සමාගමේ** 2025 ජූනි මස පළමු සතියේ සේවකයෙකුට අදාලව පහත තොරතුරු දී ඇත:

සතියකට සාමාන්‍ය වැඩ කරන පැය	දිනකට පැය 8 ක් සහ සතියකට වැඩකරන දින 5 ක්
පැයක් සඳහා මූලික ශ්‍රම අනුපාතය	රු.450/-
ඒකකයක් නිපදවීමට ඉඩ දී ඇති සම්මත කාලය	මිනිත්තු 10
ප්‍රසාද දීමනාව	ඉතිරි කරන ලද කාලයෙන් 125% ක් මූලික ශ්‍රම අනුපාතයට
පළමු සතිය තුළ සේවකයා විසින් නිපදවන ලද ඒකක ගණන	ඒකක 360

ඉහත තොරතුරු මත පදනම්ව:

ඔබ විසින් කළ යුතු දෑ:

2025 ජූනි මස පළමු සතිය සඳහා සේවකයාගේ මුළු ඉපැයීම් **ගණනය කරන්න.** (ලකුණු 04)

(B) **සීමාසහිත ABC සමාගමේ, Z නිෂ්පාදිතයට** අදාලව පහත සඳහන් තොරතුරු ඔබ වෙත දී ඇත:

වාර්ෂික ඉල්ලුම	ඒකක 8,000
ඒකකයක ගැනුම් මිල	රු.30,000/-
ඇණවුම් පිරිවැය	ඇණවුමකට රු.300,000/- බැගින්
පොරොත්තු කාලය	මාස 2 - 3
ඒකකයක් වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය	ගැනුම් මිලෙන් 25% ක්
භාවිතය	ඒකක 200 - 400

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 02)

(b) යළි ඇණවුම් මට්ටම (Re-order Level). (ලකුණු 02)

(c) අවම තොග මට්ටම. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

06 වන ප්‍රශ්නය

සීමාසහිත X (පෞද්ගලික) සමාගම, Y නිෂ්පාදිතය නිපදවනු ලබන අතර, සමාගමේ නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (A සහ B) සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් (C) ඇත.

(1) සමාගම විසින් 2025 අගෝස්තු මාසය සඳහා පහත සඳහන් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඇස්තමේන්තුගත කර ඇත:

පිරිවැය අයිතමය	පිරිවැය (රු.)
යන්ත්‍ර ක්ෂය	1,800,000
කර්මාන්තශාලා කුළිය	720,000
විදුලිය	1,200,000
තත්ත්ව පාලන වියදම්	400,000

(2) පහත සඳහන් අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත:

	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තුව
	A දෙපාර්තමේන්තුව	**B දෙපාර්තමේන්තුව**	**C දෙපාර්තමේන්තුව**
වක්‍ර ද්‍රව්‍ය පිරිවැය (රු.)	450,000	280,000	175,000
යන්ත්‍රවල වටිනාකම (රු.)	15,000,000	18,000,000	7,000,000
විදුලි පරිභෝජනය (කිලෝවොට්)	1,200	800	400
බිම් ප්‍රමාණය (වර්ග අඩි)	1,600	1,400	600
තත්ත්ව පරීක්ෂණ ගණන	24	36	40
සෘජු ශ්‍රම පැය ගණන	10,000	16,000	-
පිරිවැය විභජනය - **C දෙපාර්තමේන්තුව**	45%	55%	-
එක් නිෂ්පාදිතයක් සඳහා අවශ්‍ය සෘජු ශ්‍රම පැය ගණන	1	2	-

(3) එක් නිෂ්පාදිතයක් සඳහා ඇස්තමේන්තුගත සෘජු පිරිවැය පහත සඳහන් පරිදි වේ:

එක් නිෂ්පාදිතයක් සඳහා	රු.
සෘජු ද්‍රව්‍ය	300
සෘජු ශ්‍රමය	220
ප්‍රාථමික පිරිවැය	**520**

ඔබ විසින් කළ යුතු දෑ:

(a) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) එක් නිෂ්පාදිතයක ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 25)

07 වන ප්‍රශ්නය

සීමාසහිත Power Hub (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ: (රු.)

	හර	බැර
2024 අප්‍රේල් 01 දිනට, ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,200,000)		12,000,000
2024 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම්		12,550,000
අයදුම් සහ විභජන ගිණුම - හිමිකම් තිකුතුව		2,400,000
යන්ත්‍ර ඉවත්කිරීමේ ගිණුම		2,800,000
පිරියත සහ උපකරණ, පිරිවැයට:		
යන්ත්‍ර	8,000,000	
මෝටර් වාහන	9,500,000	
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
යන්ත්‍ර		1,600,000
මෝටර් වාහන		4,750,000
2025 මාර්තු 31 දිනට, තොගය	9,425,300	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	21,519,500	6,899,700
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	7,593,825	
2024 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය		645,000
ගෙවූ අතුරු ලාභාංශ	3,000,000	
විකුණුම්		63,352,500
විකුණුම් පිරිවැය	34,843,875	
ප්‍රචාරණ වියදම්	3,600,000	
විකුණුම් කොමිස්	1,800,000	
ප්‍රවාහන සහ ගමන් වියදම්	1,074,700	
වැටුප් සහ වේතන	2,500,000	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	209,800	
විදුලිය	1,150,000	
කාර්යාල කුලිය	300,000	
බැංකු ගාස්තු	80,200	
ගෙවූ ආදායම් බදු	2,400,000	
	106,997,200	**106,997,200**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට, තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.9,200,000/- ක් විය.

(2) 2022 අප්‍රේල් 01 දින, රු.3,300,000/- කට මිලට ගත් යන්ත්‍රයක්, 2024 ඔක්තෝම්බර් 01 දින රු.2,800,000/- කට විකුණන ලදී. තවද, රු.3,000,000/- කට නව යන්ත්‍රයක් 2024 ඔක්තෝම්බර් 01 දින මිලට ගත් අතර, එදිනම එය ස්ථාපනය කරන ලදී. යන්ත්‍රය විකිණීමෙන් ලද මුදල්, යන්ත්‍ර ඉවත්කිරීමේ ගිණුමේ සටහන් කර ඇති අතර, නව යන්ත්‍රයේ පිරිවැය, යන්ත්‍ර ගිණුමේ සටහන් කර ඇත. මීට අමතරව, මේ සම්බන්ධයෙන් වෙනත් සටහන් ගිණුම් පොත්වල තබා නොමැත.

(3) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

යන්ත්‍ර	වර්ෂ 10
මෝටර් වාහන	වර්ෂ 4

(4) පහත සඳහන් ඉදිරියට කළ ගෙවීම් සහ උපචිත වියදම්, 2025 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල ගිණුම් ගත කර නොමැත:

	රු.
ඉදිරියට ගෙවූ කුලිය	60,000
ගෙවිය යුතු විගණන ගාස්තු	370,000

(5) 2024/25 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම රු.2,465,000/- ක් වන අතර, එයින් රු.2,400,000/- ක මුදලක්, කාර්තුමය වාරික වශයෙන් වර්ෂය තුළදී ගෙවා ඇත.

(6) 2025 ජනවාරි 31 දින, සමාගම විසින් දැනට එහි සිටින සියළුම කොටස්කරුවන් සඳහා හිමිකම් නිකුතුවක් සිදුකළ අතර, 2024 අප්‍රේල් 01 දිනට පැවති සෑම කොටස් 5 කටම එක් කොටසක් රු.10/- බැගින් නිකුත් කරන ලදී. මුදල් ලැබීම්, "මුදල් ගිණුමට" හර කොට, "අයදුම් හා විභජන ගිණුම - හිමිකම් නිකුතුව" ගිණුමට බැර කොට ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් සටහන් තබා නොමැත.

(7) සමාගම, 2024 සැප්තැම්බර් 30 දින, එහි සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රු.2.50 ක් බැගින් අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

(8) 2025 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය, 5% ක් ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

(9) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, 2025 මැයි 30 දින ලබා දී ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත Power Hub (පෞද්ගලික) සමාගමේ කළමනාකාරීත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් වූ අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අදින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව නිරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.